# සංවර්ධනයෙහි ලා කාන්තා දායකත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක්

කේ. පී. ආර්. සුජානි අසංගිකා*

***සංක්ෂේපය***

*සංවර්ධනය යනු සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික වූ සෑම අංශයකම සිදුවන්නා වූ ගුණාත්මක වර්ධනයකි. බහුමානික සංකල්පයක් වන සංවර්ධනය ලෝකයේ රටවල් විවිධාකාරයෙන් භුක්තිවිඳිති. සංවර්ධනය යනුවෙන් මුල්කාලීනව හඳුනාගත්තේ ඒක පුද්ගල ආදායම (Pre Capital Income-PCI) ඉහළ තත්ත්වයක් සාධනය කරගැනීම මතය. නමුත් මෙම ක්‍රමවේදයේ දී පුද්ගල සංවර්ධනය පිළිබඳ කිසිදු ආකාරයකින් ඇගයීමට ලක් නොවීය. එහි පවත්නා වූ දුර්වලතා මගහරවා ගනු වස් භෞතික ජීවන තත්ත්ව දර්ශක (Physical Quality of Life Index-PQLI) උපයෝගී කරගනිමින් සංවර්ධනය මිනුම් කරන ලදි. ආර්ථික සංවර්ධනය හා සමාජ සංවර්ධනය යන දෙයංශයම අන්තර්ගතවන පරිදි මානව සංවර්ධන දර්ශකය (Human Development Index-HDI) හඳුන්වා දෙන ලදි. 2000 වර්ෂය වන විට සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ (Millennium Development Goals –MDGs) මගින් යම් යම් අභිමතාර්ථ මුදුන් පමුණුවාගෙන ඇත. වර්තමානය වන විට එය පාරිසරික ප්‍රතිපත්ති හා තදනුබද්ධ වෙමින් තිරසර සංවර්ධන අභිමතාර්ථ (Sustainable Development Goals) වශයෙන් 2030 වර්ෂය දක්වා කාලපරාසය තුළ ක්‍රියාත්මක වන ක්‍රියාදාමයක් වශයෙන් හඳුනාගත හැකි ය. කාන්තාව පිළිබඳ විමසා බැලීමේ දී, ස්ත්‍රී පුරුෂ සමාජභාවය වනාහී ලිංගික වෙනස්කම් සඳහා දෙනු ලබන සමාජීය/සංස්කෘතික සහ ආර්ථික වටිනාකම් වේ. මෙය සංස්කෘතියෙන් සංස්කෘතියට මෙන්ම කාලයෙන් කාලයට ද වෙනස් විය හැකි ය. කාන්තාව හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය*

* kprsujani@gmail.com